# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,286 - 2022 ජුනි මස 24 වැනි සිකුරාදා - 2022.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු හංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 516 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජූලි මස 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## වලපනේ දිසා අධිකරණයේ දී ය

## විකිණීමේ දැන්වීමයි

මහනුවර දිසා අධිකරණයේ
නඩු අංකය :- DMB 00042/20
වලපනේ දිසා අධිකරණයේ
ඇස්කීසි අංකය :- 16/22

මහනුවර, කටුගස්තොට පාර, අංකඃ 187 හි ප්‍රධාන කාර්යාලය පිහිටි සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ් ලෙසත් නම් වෙනස් කිරීමෙන් පසුව දැන් සී බී සී ෆිනෑන්ස් එල්ටීඩී

................*පැමිණිලිකාර සමාගම.*

*එදිරිව*

01. පින්නදූවගේ සම්පත් ලලන විජේරත්න,
අංක : 217, රාගල පාර, පදියපැලැල්ල.

02. රාජනායක මුදියන්සේලාගේ අනුලාවතී,
අංකඃ 133, රාගල පාර, පදියපැලැල්ල.

.........................*විත්තිකරුවන්.*

වර්ෂ 2021 ක් වූ ජුලි මස 19 දින දරන මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක සඳහන් නඩුවේ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් තිස් දෙලක්ෂ පනස් දහස (රු.3,250,000.00) ක මුදලින් මේ දක්වා ගෙවා ඇති රුපියල් අසූ පන් දහස් තුන්සිය අනූ නමයයි ශත තිහ (රු.85,399.30) ක මුදල අඩු කොට ඉතිරි රුපියල් තිස් එක් ලක්ෂ හැට හතර දහස් හාරසියයයි ශත හැත්තෑව (රු.3,164,600.70) ක මුදල අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරි පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා ආඥා කොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් තිස් එක් ලක්ෂ හැට හතර දහස් හාරසියයයි ශත හැත්තෑව (රු.3,164,600.70) ක මුදල සහ පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරි පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළට අයත් සියළුම අයිතිවාසිකම් පරවශතා සහ අනුබද්ධිතයින් ද 01 වන විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියළු අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයෙහි සඳහන් දේපලෙන් උපදන සහ එකතුවන සියළු කුළී ලාභ සහ අනෙකුත් ආදයම්ද සියළු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම්ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපල නිශ්චිතව බැදී ඇති බවට හා ඇස්කීසි කළහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින්ද අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල,

**වර්ෂ 2022 ක් වූ ජූලි මස 29 වැනි දින ප.ව. 2.00** ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩහේවාහැට පල්ලේගම්පහ කෝරලේ වලපනේ ප්‍රාදේශීය සභා සීමාව තුල වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ අංක 505 A පදියපැලැල්ල ග්‍රාම නිලධාරි වසමේ පදියපැලැල්ලේ පිහිටා තිබෙන හොලිකෝට්ටේ වත්ත නමැති ඉඩමෙන් බෙද වෙන් කරන ලද වෙන් වූ අංක 04 දරන කැබැල්ල මෙම ඉඩමට බලයලත් මිනින්දෝරු එල්මෝ ප්‍රනාන්දු මහතා විසින් වර්ෂ 2017.09.14 දින මැන සකස් කොට ඇති අංක 3475 දරණ පිඹුරට අනුව මායිම්, උතුරට :- ගාමිණී හිමිකම් කියන ඉඩමද, නැගෙනහිරට :- මහා මාර්ගයද, දකුණට :- ඇල සහ මාර්ග රක්ෂිතය ද, බස්නාහිරට :- ඇල සහ මාර්ග රක්ෂිතය ද, යන මායිම් තුල පිහිටි පර්චස් හතරයි දශම හතරක් (අක්. 0, රූඩ්. 0, පර්. 4.4) ක් ප්‍රමාණය ඇති සම්පූර්ණ ඉඩම ද එය තුල පිහිටා තිබෙන රාගල පාරේ වරිපනම් අංක 217 දරන ගොඩනැගිල්ල ඇතුළු ගසකොළ පළතුරු ආදී සෑම සියලු දේ ද සම්පූර්ණයෙන් වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ O 172/307 හි ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් ඉඩම් පහත පරිදි ද විස්තර වේ.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩහේවාහැට, පල්ලේගම්පහ කෝරලේ, වලපනේ ප්‍රාදේශීය සභා සීමාව තුල වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ අංක 505 පදියපැලැල්ල ග්‍රාම නිලධාරි වසමේ පදියපැලැල්ලේ පිහිටා තිබෙන හොලිකෝට්ටේ වත්ත නමැති ඉඩමෙන් බෙද වෙන් කරන ලද වෙන් වූ අංක 04 දරන කැබැල්ල නම් වූ බලයලත් මිණින්දෝරු එල්මෝ ප්‍රනාන්දු මහතා විසින් වර්ෂ 1996.08.23 දින මැන සකස් කොට ඇති අංක 732 දරන පිඹුරට අනුව මායිම්, උතුරට :- මෙම ඉඩමේ අංක 03 දරණ කැබැල්ල ද, නැගෙනහිරට :- මහා මාර්ගයද, දකුණට :- මෙම ඉඩමේ අංක 05 දරන කැබැල්ල ද , බස්නාහිරට :- මෙම ඉඩමේ අංක 05 දරන කැබැල්ල ද, යන මායිම් තුල පිහිටි පර්චස් හතරයි දශම හතරක් (පර්. 4.4) ක් ප්‍රමාණය ඇති සම්පූර්ණ ඉඩම ද එය තුල පිහිටා තිබෙන රාගල පාරේ වරිපනම් අංක 217 දරන ගොඩනැගිල්ල ඇතුළු, ගසකොළ පළතුරු ආදී සෑම සියලු දේ ද සම්පූර්ණයෙන් වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ O 172/261 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වලපනේ.

වර්ෂ 2022 ක් වූ මැයි මස 30 වැනි දින දී ය.

06-332

---

## අධිකරණ නියෝගය මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

### නුගේගොඩ දිසා අධිකරණයේ දී ය

එච්. එන්. බී. ෆයිනෑන්සි ලිමිටඩ්,
(මින් පෙරදී එච්. එන්. බී. ග්‍රාමීන් ෆයිනෑන්ස් ලෙස හඳුන්වනු ලැබූ)
සහ එහි ලියාපදිංචි කාර්යාලය,
අංක 168, නාවල පාර,
නුගේගොඩ.

නඩු අංකය : MB/203/2019
ස්වභාවය : උකස්
කාර්යය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 3,935,406.78

යය
...................*පැමිණිලිකරු.*

*එදිරිව*

උක්වත්ත ආචාරිගේ වෝල්ටර් රණසිංහ,
පළමු පටුමග,
වැව ගෙදර,
දිවුලපිටිය.

.....................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව නුගේගොඩ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 07 වැනි දින දරන සමථ තීන්දු ප්‍රකාශය අනුව කටයුතු කිරීමට විත්තිකරු අපොහොසත් වීම මත සමථ තීන්දු ප්‍රකාශයේ 04 වන කොන්දේසිය පරිදි විත්තිකරු විසින් සමථ තීන්දු ප්‍රකාශයේ සඳහන් ආකාරයට සමථය ප්‍රකාරව කටයුතු නොකර ඕනෑම වාරික දෙකක් (අනුයාත නොවන) නොගෙවා පැහැර හරින්නේ නම් සහ/හෝ 2024 මාර්තු 15 දින හෝ ඊට පෙර සම්පූර්ණ මුදල ගෙවා නිම නොකරන්නේ නම් සමථය ඉටු නොකලා සේ සලකා සමථයේ සඳහන් මුදලින් ඒ වන විට ගෙවා ඇති මුදල අඩුකර ඉතිරි මුදල අයකර ගැනීම සඳහා විත්තිකරුට එරෙහිව නොතීසි රහිතව වුව ද ඇස්කීසි ගැනීමටත් එසේ ඇස්කීසි ගැනීමට සිදු වුවහොත් පැමිණිල්ලේ උපලේඛනගත දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එකී හිඟ මුදල් අයකර ගැනීමටත්, ඒ සඳහා යන වියදම විත්තිකරුගෙන් අයකර ගැනීමට ද, දෙපාර්ශවය එකඟ වී සමථ වූ බවට තීන්දු කොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

පහත උපලේඛනයේ විස්තර කරන දේපල තහනමට ගෙන ඉහත නම් සඳහන් විත්තිකරුගෙන් පැමිණිල්ලට අය විය යුතු රුපියල් තිස්හය ලක්ෂ හැට හතර දහස් හාරසිය දෙකයි ශත දොළහ (රු. 3,664,402.12) මුදලින් මේ වන විට ගෙවා ඇති රුපියල් දෙලක්ෂ තුන්දහස (රු. 203,000.00) ක මුදල අඩු කළ පසු තව දුරටත් අයවිය යුතු රුපියල් තිස්හතර ලක්ෂ හැට එක් දහස් හාරසිය දෙකයි ශත දෙළහක (රු. 3,461,402.12) ක මුදල සහ ඇස්කීසි ගාස්තු පැමිණිල්ලට අය කරවා ගැනීම සඳහා ඇසිකීසි ගැනීමට

පැමිණිල්ලට අවසර ලබා දී ඇති බැවින් පහත උපලේඛනයේ දක්වෙන දේපළ උකස් පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි තහනමට ගෙන මෙම අධිකරණය විසින් නියම කරනු ලබන වෙන්දේසිකරුවෙකු සහ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසිය විකිණිය යුතු බවටද දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී සමථ තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් නුගේගොඩ දිසා අධිකරණය මගින් මා වෙත නිකුත් කර ඇති අධිකාරි පත්‍රය අනුව පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2022 ක් වූ ජූලි මස 22 වැනි දින පෙ. ව. 10.00 ට** උපලේඛනයේ සඳහන් නිශ්චල දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### *උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, අලුත්කුරු කෝරළේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, බරවාවිල ග්‍රාම නිලධාරි වසමේ, බරවාවිල ග්‍රාමය තුළ පිහිටි "පුහුල්හේන" නම් වූ ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. එම්. එෆ්. එස්. වීරසිංහ විසින් 2013.01.05 වන දින මැන සකස් කරන ලද අංක 4261/4 දරන පිඹුරෙහි සඳහන් කැබලි අංක 4 කියන ඉඩමට මායිම් උතුරට : ඉහත සඳහන් 4261/4 දරන පිඹුරෙහි සඳහන් කැබලි අංක 9 සහ 8 ද, නැගෙනහිරට : ඉහත සඳහන් පිඹුරෙහි කැබලි අංක 5 ද, දකුණට : ඉහත සඳහන් පිඹුරෙහි කැබලි අංක 22ද, බස්නාහිරට : ඉහත සඳහන් ඉඩමෙහි කැබලි අංක 3 සහ 21 ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළව (අ.0, රූ.0, පර්. 15) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේත් එකී පිඹුරෙහි සඳහන් සියලු මාර්ග අයිතිවාසිකම් ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක J/16/137 හි ලියාපදිංචි වී ඇත.

*ඉඩමට පිවිසීම.-* දිවුලපිටිය නගරයේ සිට කුරුණෑගල මාර්ගයේ කිලෝමීටර් එකක් පමණ ඉදිරියට යන විට වමට පින්නකැලේවත්ත මාර්ගය හමුවේ. එම මාර්ගයේ මීටර් දහයක් පමණ ඉදිරියට ගොස් හමුවන Y හංදියෙන් දකුණට ඇති හපුගහගම මාර්ගයේ මීටර් දෙසිය පනහක් පමණ ඉදිරියට ගිය විට අදාළ විෂයගත දේපළ දකුණට පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%), (2) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු, (3) වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු, (4) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල දින 30ක් ඇතුලත දී නුගේගොඩ දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොවිඩ් 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

යූ. පී. නිශාන්ත එම්. කුමාර,
බලයලත් තක්සේරුකරු/වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්,
නුගේගොඩ දිසා අධිකරණය සහ මහනුවර දිසා අධිකරණය.

අංක 23, කඩවත්ගම,
කඩුගන්නාව,
දුරකථනය : 0771908960, 0704310979
නිවස : 0812571500
ඊමේල් : ronaniassociate @gmail.com

06-356